*සැ. යු.* — (i) 2014.03.28 දින පළ වූ අංක 1,856 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,857 - 2014 අප්‍රේල් මස 04 වැනි සිකුරාදා - 2014.04.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 566 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 570 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අප්‍රේල් මස 25 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

විදුලි කාර්මික (වීථි ලාම්පු භාරකරු) - 111 වැනි පන්තිය (ප්‍රාථමික අර්ධ ශිල්පීය)

02. *වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(IV) හි PL2-2006A අනුව
රු. 12,210-18x130-14,550
(මෙම වැටුප් ක්‍රමයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

03. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි* :

03.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

03.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න අඛණ්ඩ වසර 03ක ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටෙකදී පමණක් යාබද පළාත් පාලන බල ප්‍රදේශයන්හි අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ඇත.

03.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

03.4 සියලුම අයදුම්කරුවන් විශිෂ්ඨ යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තකු විය යුතු ය.

03.5 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයෙකු විය යුතු ය.

04. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

04.1 *අධ්‍යාපන සුදුසුකම්*

දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

04.2 *ශිල්පීය නිපුණතා /ප්‍රවීණතා*

විදුලි කාර්මික වෘත්තියට අදාළව පහත සඳහන් කාර්මික නිපුනතාවය/නිපුනතා ලබාගෙන තිබිය යුතු ය.

04.2.1 ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වන මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම;

*හෝ*

04.2.2 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

*හෝ*

04.2.3 ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

04.2.4 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

04.2.5 ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;

*හෝ*

04..2.6 වෙනත් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහිතකය ලබා තිබීම.

04.3 *පළපුරුද්ද :*

විදුලි කාර්මික, විදුලි ලාම්පු භාරකරු හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් අවුරුදු දෙකකවත් පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු දෙකක්වත් විය යුතු ය.)

05. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

05.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

05.3 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. පරිවාස කාලය අවසානයේ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක තැනැත්තන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා සලකා බලනු ලැබේ.

05.5 2007.05.28 දිනැති 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත්විය යුතු ය. (III වන මට්ටමේ ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතු ය.)

05.6 මෙහි සඳහන් කර ඇති බඳවා ගැනීමේ, කොන්දේසි සේවා ව්‍යවස්ථා හා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසිවලට අමතරව රජය, පළාත් සභාව, පළාත් පාලන දෙපාර්තමේන්තුව හා සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරන නියෝග ද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද මෙම පත්වීම යටත් ය.

05.7 ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ බඳවා ගැනීම් සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි අදාළ වේ.

05.8 නියම කරනු ලැබුවහොත් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි වීමට සිදු වනු ඇත.

06. *කාර්යක්ෂමතා කඩඉම් :*

බඳවා ගැනීමේ පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතර වන වැටුප් පියවරට (රු. 12,600) එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. මුල් පත්වීමේ දිනයේ සිට වසර 03ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. තනතුරේ ස්ථිර කිරීම සඳහා කාර්යක්ෂමතා කඩඉම සමත්ව තිබීම අනිවාර්ය වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

07.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් සූදානම්ව තබාගත යුතු ය.

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත,
ii) අදාළ අධ්‍යාපන සහතිකයේ මුල්පිටපත ;
(iii) විදුහලේ අස්වීමේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය ;
(v) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;
(vi) වෘත්තීය නිපුණත්වය සනාථ කිරීමට අවශ්‍ය සහතික ;
(vii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික/ලිපි.

07.2 තනතුරු පුරප්පාඩු ගණන සඳහා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරා ගෙන බඳවා ගනු ලැබේ.

08. *අයදුම්කළ යුතු ආකාරය :*

08.1 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

08.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි ඒ4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2014.04.17 දින හෝ ඊට පෙර "ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.)

08.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "විදුලි කාර්මික තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු ය.

08.4 අසම්පූර්ණව හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 27,3060 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

09. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේදී මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය හා මෙම සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

ඩී. කොඩිතුවක්කු,
ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අංකය :

*මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික (වීථි ලාම්පු භාරකරු) තනතුර සඳහා අයදුම්පත*

01. 1.1 මුලකුරු සමග නම :—————————————.
1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————————.

02. 2.1 ස්ථිර ලිපිනය :—————————————.
2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලයීය ලිපිනය :—————————————.

03. 3.1 උපන් දිනය :—————————————.
3..2 2014.04.17 දිනට වයස :——————. අවුරුදු :——————. මාස :——————. දින :——————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :—————————————.

05. දුරකථන අංකය :—————————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————————.

07. අධ්‍යාපන සුදුසුකම් :—————————————.

07.1 අධ්‍යාපනය ලද පාසල :—————————————.
07.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය:—————————————.

වසර :——————. විභාග අංකය :——————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

07..3 අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වසර :——————. විභාග අංකය :——————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

08. වෘත්තීය සුදුසුකම්
08.1 :————————————.
08.2 :————————————.
08.3 :————————————.

09. සේවා පළපුරුද්ද :————————————.

*අයදුම්කරුගේ ප්‍රකාශය*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :2014.————————————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................ (ලිපිනය) හි පදිංචි .................................................................. (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————————————.
සහතික කරන්නාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දිනය :2014.————————————.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————————————.
තනතුර :————————————.
ලිපිනය :————————————.

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.

මෙම ඉල්ලුම්කරු වන ..................................... (නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................................. (තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි බවත් සහතික කරමි.

————————————.
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :2014.————————————.

04-22

# පළාත් පාලන නිවේදන

## බදුල්ල මහ නගර සභාව

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.11.28 දින අංක 06 දරන සභා සම්මුතිය අනුව තීරණය කර ඇත.

2014.02.07 වැනි දින අංක 1849 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ පරිදි එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව විරෝධතාවයක් නොමැති හෙයින් එම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2014ක් වූ මාර්තු මස 12 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම්පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 1 | බදුල්ල දුම්රිය පොළ පාර අතුරු මාර්ගය | දුම්රිය පොල පාර | 114/15 | 116,114/4,114/5,114/12 114/24 | 114/1,61,114/15 114/15A/114/17 | 81.5 | 3.00 |

04-61

---

## බදුල්ල මහ නගර සභාව

4

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48 (1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.09.26 දින අංක 06 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

2013.11.15 දින අංක 1837 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ පරිදි එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව විරෝධතාවයක් නොමැති හෙයින් එම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2014 මාර්තු මස 12 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| *අනු අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම් පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 1 | මහියංගණ පාර 2 වන අතුරු මාර්ගය | මහියංගණ පාර | 163/2 | | 163/2, 163/3, 163/4, 163/3/1/1, 163/6 | 80 | 3.00 |

04-60

### හපුතලේ නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, ඌව පළාතේ, පළාත් සභාවේ පළාත්පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ සහ 2010.10.05 දිනැති අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ නිවේදනය කරනු ලැබූ, ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට අදාළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඌව පළාතේ, පළාත් සභාව විසින් 2013.04.04 වැනි දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී සම්මත වූ එකී අතුරු ව්‍යවස්ථාව, හපුතලේ නගර සභාව විසින් 2013.11.27 වැනි දින පවත්වන ලද නගර සභා රැස්වීමේ දී සම්මත කිරීමෙන් එය අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

උපුල් අමරජීව දිසානායක,
සභාපති,
හපුතලේ නගර සභාව.

2014 මාර්තු මස 18 වැනි දින,
හපුතලේ නගර සභා කාර්යාලයේ දී ය.

04-198/1

### හපුතලේ නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, ඌව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ සහ 2010.11.02 දිනැති අංක 1678/46 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ නිවේදනය කරනු ලැබූ, ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට අදාළ මදුරුවන් හා රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඌව පළාතේ, පළාත් සභාව විසින් 2013.04.04 වැනි දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේදී සම්මත වූ එකී අතුරු ව්‍යවස්ථාව, හපුතලේ නගර සභාව විසින් 2013.11.27 වැනි දින පවත්වන ලද නගර සභා රැස්වීමේදී සම්මත කිරීමෙන් එය අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

උපුල් අමරජීව දිසානායක,
සභාපති,
නගර සභාව.
හපුතලේ

2014 මාර්තු මස 18 වැනි දින,
හපුතලේ නගර සභා කාර්යාලයේ දී ය.

04-198/2

---

### කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාවත කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මාවතට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන්ගෙන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 24(3) වගන්තිය යටතේ උපලේඛනයේ සඳහන් මාවත කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ස්ථිර වශයෙන්ම පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අසේල ඒකනායක
සභාපති,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *දෙපස ඉඩම් හිමියන්* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|---|---|---|---|
| 01 | කිතුලේතැන්න (0681) | කිතුලේතැන්න මාවත | මහනුවර මහියංගන ප්‍රධාන මාර්ගයේ පච්චකාට්ටුව හන්දියෙන් ඇතුල්වී කි.මී. 1.2 ක් දුරින් පිහිටි පළමුවන බෝගස ස්ථානය | ශ්‍රීමා අල්විස් මහත්මියගේ නිවස අසලින් | ආරම්භය වම්පස කිතුලේතැන්න ගොවිපල ගල් පිහිල්ල පන්සලට අයත් ඉඩම, රත්මල් ඔය ඇල රක්ෂිතය, රත්මල්ඔය, ගණිතාංග ගමට හැරෙන මාර්ගය, ගල්පිහිල්ල පන්සලට අයත් ඉඩම, ඒ. එම්. අලහකෝන් මහතාගේ ඉඩමට යන මාර්ගය, ඊ. එම්. සී. එච්. ඒකනායක මහතාගේ ඉඩම, එන්. බී. දසනායක මහතාගේ ඉඩම, එම්. අයි. අතුකෝරළ මහතාගේ ඉඩම, රජයේ ඉඩම දකුණුපස ගල්පිහිල්ල පන්සලට අයත් ඉඩම, කුඹුරු වනාත, රත්මල් ඔය, ඇල රක්ෂිතය, ගල්පිහිල්ල පන්සලට අයත් ඉඩම, පන්සල ඒ. එම්. යූ. ඩබ්ලිව්. අධිකාරිනායක මහතාගේ ඉඩම ඊ. එම්. පී. ඒකනායක මහතාගේ ඉඩමට යන මාර්ගය, සුනීතා දමුණුගොල්ල මියගේ ඉඩම, තරිඳු දිල්ෂාන් දමුණුගොල්ල මහතාගේ ඉඩම, ඩී. ලෝරන්ස්සිරි මහතාගේ ඉඩම, ඊ. එම්. අනුර බණ්ඩාර මහතාගේ ඉඩම, ඊ. එම්. එම්. එන්. ඒකනායක මහතාගේ ඉඩම, ලොට් අංක 11ඒ ඉඩම, ආර්. එම්. ගාමිණී රත්නායක මහතාගේ ඉඩම සහ ශ්‍රීමා අල්විස් මහත්මියගේ ඉඩම. | අඩි 990 | අඩි 10 |

04-199

## කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාර පාරක් හෝ පටු මගක් නම් කිරීමේ පනතේ විධිවිධාන පරිදි මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ඇමති ගරු සරත් ඒකනායක මැතිතුමා විසින් දෙන ලද අනුමැතිය ප්‍රකාර, පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ප්‍රසිද්ධ පාර " නිතුලේතැන්න මාවත" නමින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අසේල් ඒකනාක,<br>
සභාපති,<br>
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 20 වැනි දින,<br>
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,<br>
මැණික්හින්න.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | මහනුවර |
| 3. | නම් කරන ලද මාර්ගය | : | නිතුලේතැන්න |
| 4. | පාරේ ආරම්භය හා අවසානය | : | මහනුවර මහියංගන ප්‍රධාන මාර්ගයේ පච්චකාට්ටුව හන්දියෙන් ඇතුල්වී කිලෝ මීටර් 1.2 ක් දුරින් පිහිටි පළමුවන බෝගස ස්ථානයේ සිට ශ්‍රීමා අල්විස් මහත්මියගේ ඉඩම දක්වා කොටස. |

04-200

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | රු. | ශ. |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| අප්‍රේල් | 2014.04.04 | සිකුරාදා | 2014.03.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.11 | සිකුරාදා | 2014.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.17 | බ්‍රහස්පතින්දා | 2014.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.25 | සිකුරාදා | 2014.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.